# කතන්දර පැංචා



කර්තෘ : කේ.එම්. ගඟුලි ශමීක්ෂණා කුලතුංග

කතන්දර පැංචා

කේ.එම්. ගඟුලි ශමීක්ෂණා කුලතුංග

ISBN 978-624-206-817-6

2023 දෙසැම්බර් 04

# පිදුම

මගේ දයාබර අම්මාට , අප්පච්චිට , අක්කාට සහ පුංචි මල්ලියාට ආදරයෙන් පුදමි!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මහපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය – මහනුවර

**2023.10.20**

# පටුන


| | පිටු අංකය |
|---|---|
| පිදුම | iii |
| පෙරවදන | iv |
| 1.රිළා රාළට පාඩමක් | 1 - 3 |
| 2. පාලමෙන් එතෙර පුංචි ලීලා | 4 - 11 |
| 3. සිංහයා රජ වුණ හැටි | 12 - 16 |
| 4.තුහීගේ චාරිකාව | 17 - 28 |

# 1. රිළා රාළට පාඩමක්

එකමත් එක කාලෙක හිටියා එක රිළවෙක්. දවසක් මේ රිළවා ගහෙන් ගහට පැන පැන යද්දි දැක්කා එක කූඹි ගුලක කැවුම් ගෙඩියක් තියෙනවා.කැවුම් කන්න කෑදර වුණු රිළවා ගුලට අත දැම්මා. කැවුම් ගෙඩිය ගන්න අත දිග මදි වුණා.



රිළවා ගුල ඇතුළට වලිගය දාලා කැරකුවා.ඒක දැකපු කූඹියා හිතුවා මෙයා අපේ කෑම හොරකම් කරනවා කියලා.



කුඹියාට තරහා ගිහින් රිළවාගේ නැට්ට හැපුවා.රිළවා හූ තියලා කැලයට දිව්වා.එදායින් පස්සේ ඒ රිළවා පෙරේත වුණේ නම් නෑ.



# 2. දේදුනු පාලමෙන් එතර වූ පුංචි ලීලා.

එකමත් එක කාලෙක පොඩි ගමක් තිබුණා. ඉතින් තිබුණා වගේම ඒ ගම හරිම ලස්සනයි. දිය ඇලි, ගංගා, වැව්, පොකුණු, කඳු, කැලෑ එහෙම ගොඩක් තිබුණා. ඒ දිහා බලාගෙන ඉන්න හරිම ආසයි. ඒ ගමට දවසක් ලොකු මකරෙක් ආවා. මේ ගමේ හිටියා එක්තරා එඩිතර ගැහැනු ළමයෙක්. එයාගේ නම ලීලා. එයාට වයස අවුරුදු 12යි.



මේ මකරාව එලවන්න නම් රහස් දොරටුවෙන් මකර යතුර ගන්න ඕන. ඒකට යන්න නම් දේදුනු පාලමෙන් එතෙර වෙන්න ඕන. දේදුනු පාලම ඉස්සරහ බහිරවයෙක් ඉන්නවා. එයාගේ ප්‍රශ්නෙට උත්තර දෙන්න බැරි වෙන ඕනම කෙනෙක්ව එයා එක කටට ගිලලා දමනවා.

මේකට ඒත් ලීලා බය වුණේ නෑ. එයා හරිම බුද්ධිමත් . ගම බේර ගන්න ඕන හින්දා එයා එදාම දේදුනු පාලම හොයා ගෙන ගියා.එයා යන අතරමග වයසක ගැහැනු කෙනෙක් මුණගැසුනා.එයා හාමතේ හිටියේ.ලීලා එයා ළඟ තිබුණු ඔක්කෝම කෑම ටික ඒ වයසක

ගැහැනු කෙනාට දුන්නා විතරයි, ඒ වයසක ගැහැනු කෙනා සුරංගනාවියක් බවට පත් වුණා.



“ඔයා කොහෙද යන්නේ?” සුරංගනාවිය ඇහුවා. “මම දේදුනු පාලම හොයාගෙන යනවා.” “එහෙනම් මම කියන දේ අහගන්න. ඒ බහිරවයා ඔයාගෙන් අහයි, ලෝකෙ අමාරුම දේ මොකක්ද කියලා. එතකොට ඔයා කියන්න ඒ ජීවත් වෙන එක කියලා.ඔයා මේ පලස උඩ නැගලා යන්න.එතකොට ඔයාට එහෙට ඉක්මනට යන්න පුලුවන්. එහෙනම් අපි සමු ගමු.”සුරංගනාවිය එහෙම කියලා අතුරුදහන් වුණා.

එයා එතෙනට ගියා. සුරංගනාවිය කියපු විදිහටම බහිරවයා ප්‍රශ්නය ඇහුවා. ලීලා

උත්තරය කියලා යන්න හදනකොට, දේදුනු පාලම එයාගෙන් මෙහෙම ඇහුවා.

"ඔයා මාව එතෙර කරන්න කලින් මගේ ඇඟට වතුර ටිකක් දාන්න. එතකොට ඔයාට ඇත්ත පාලම හොයා ගන්න පුලුවන්" ලීලා පාලම කියපු විදිහටම කරා.



එයාට ඇත්ත පාලම හම්බවුණා. එයා එතෙර වුණා.



එයා යතුර අරගෙන මකරා ඉන්න තැනට ගිහින් යතුර මැද තිබුණු ගින්දර වල රූපය හොඳට ඇතිල්ලුවා.මකරා එවෙලේම නැති වුණා.හැමෝම සතුටින් එයාව වැළඳගෙන ස්තුති කළා.එදා ඉඳන් ඒ ගමේ මිනිස්සු, සත්තු එහෙම සතුටින් ජීවත් වුණා.



# 3. සිංහයා රජ වුණ හැටි.

ඉස්සර එක කැලයකට හිටියේ එක සිංහයයි. ඒ සිංහයෝ දැන් වගේ නම් නෙමෙයි. එයාලා මස් කෑවේ නෑ. එයාලා කෑවේ තණකොළ, බඩ ඉරිඟු වගේ කෑම ජාති. දවසක් මේ සිංහයෙක් තණකොළ කකා ඉද්දී දැක්කා එක පොළඟෙක් හා පැටවු දෙන්නෙක්ව කන්න යනවා.



සිංහයා ඉක්මනට ගිහින් ඒ දෙන්නාව බේරා ගත්තා. ඉතින් මේ හා පැටවු දෙන්නා ගිහින් මේ සිද්ධිය බකමූණු රාජාට කිව්වා.

කැලේට රජ කෙනෙක් ඕන වෙලයි තිබුණේ. කැලේ ඉන්න සතුන්ට කරදරයක් වුණාම උදවු කරන්න සිංහයාව රජ කළා.ඒත් සිංහයා රජ වුණේ ටික කාලයයි.දවසක් සිංහයා පාරේ ඇවිදගෙන යනකොට එයාට හම්බවෙනවා සතෙක්ගේ මළ කුණක්.එයා ඒක කාගෙද කියලා බලන්න ටිකක් ලෙව කෑවා. එයාට අමුතු ලේ රසක් ආවා. ඒ සිංහයා මුළු මළ කුණම කෑවා.



එයා හිතුවා "අර මම කන කෑමවලට වඩා මස් කොච්චර රසද." කියලා. ඉතින් මේ සිංහයා එදා අර බේර ගත්ත හා පැටිකෙක්ව මරාගෙන කෑවා.

අනිත් හා පැටියා ඒක ගිහින් හැමෝටම කිව්වා. සත්තු හැමෝම ගෙවල් ඇතුළට දිව්වා. සිංහයා කැලෑව ඇතුළටම ගිහින් තව සත්තු හෙව්වා. කවුරුත් නැති හින්දා සිංහයා එදා ඉඳලා දඩයම් කරන්න පටන් ගත්තා.ඔන්න ඔහොම තමයි සිංහයා රජ වුණේ. ඊට පස්සෙ ඔහොම තමයි සිංහයා රජ කම නැති කර ගත්තේ.



# 4. තුෂීගේ චාරිකාව

“තුෂී” පුංචි ගැහැනු ළමයෙක්.ඉස්කෝලේ නිවාඩු නිසා දවසක් එයාගේ තාත්තා කැලයට යන්න චාරිකාවක් සූදානම් කරා. එදා තුෂීගේ අක්කාට හරි සතුටුයි.එයාගේ අම්මා හවස බඩු අරගන්න ගියා. යනකොට තුෂීවයි, එයාගේ අක්කාවයි නැන්දලාගේ ගෙදර තියලා ගියේ. එයාගේ අක්කා සතුට වැඩිකමටම නැන්දාට චාරිකාව ගැන ඔක්කොම දේවල් කිව්වා. නැන්දාට පිස්සු හැදිලා වාගේ අපේ තාත්තාට කෝල් කර කර එයාගේ පවුලේ අයත්

එක්කන් යන්න කියනවා. "මේක අපේ පවුලේ අය යන ගමනක්නේ. කාර් එකේනෙ යන්නෙත්.අපේ පවුලේ හතර දෙනයි, එයාලගේ පවුලේ හය දෙනයි.ඔක්කොම දහ දෙනයි. අපේ තාත්තා කිව්වා කාර් එකේ දහ දෙනෙකුට යන්න බැරි නිසා ආයෙම යනකොට වෑන් එකක හැමෝම යමු කියලා".

චාරිකාව යන්න කලින් තාත්තාගේ ඔෆිස් එකේ මැනේජර්ගෙන් නිවාඩුවක් ගන්න කියලා යනකොට, මැනේජර් නටනවා! "මිස්ටර් මම ඇතුලට එන්නද" කියලා අහන කොට මැනේජර්ට හරි ලැජ්ජයි. "ආ ටයිසන්

ඔයා දැක්කද මම නටනවා?" "ඔව් සර්!සර්

නම් නැට්ටුක් කාරයෙක් වගේ නටනවා."



“මේක,කාටවත් කියන්න එපා හොඳේ.” “හරි හරි සර්, බය වෙන්න එපා මම කාටවත් කියන්නෑ.ඒක නෙමෙයි සර් මම මගේ පවුලේ අයත් එක්ක කැලයකට චාරිකාවක් යන්න හිතාගෙන ඉන්නවා. සර්ට හිතා ගන්න පුලුවන්නෙ මම ඇයි ආවෙ කියලා.”

“ඇත්තටම ඇයි ඒ ටයිසන්?” “අයියෝ සර් නිවාඩුවක් ඕන කියලා කිව්වේ.” “ආ... හරි හරි සතියක් උනත් නිවාඩු දෙන්නම් හැබැයි කාටවත් අරක කියන්න එපා හොඳේ.” “හරි හරි සර්, ස්තුතියි සර්.”

තාත්තා නිවාඩු අරගෙන ඊළඟ දවසෙම අපි කැලයට ගියා. චිප්ස් කකා සතුටින් විනෝදයෙන් ගියා. කැලය ඇතුලට යන්නට පෙර දුරම දුර ඉඳලා මට ඒ කැලය යාන්තමින් පෙනුණා. මම අක්කාගෙන් ඇහුවා “අපි ඒ පෙනෙන කැලයටද යන්නේ” කියලා. අක්කා දන්නෙත් නැති නිසා තාත්තාගෙන් ගෙන් ඇසුවා. “අපි තාම එතනට ලඟා වුනේ වත් නෑ පුතේ” එහෙම තමයි තාත්තා කිව්වේ.ඒක මහියංගනයේ තියෙන වැදි ගම්මානයක කැලයක්.අපි හවස් වෙනවිට කැලයට ගියා. කූඩාරම් ගැහුවා. රෑට අම්මා රොටි හදලා

දුන්නා.අපි ඒවා කාලා නිදා ගත්තේ ඊළඟ දවසේ ඇවිදින්න යන්න හිතා ගෙන.

අපි හිතපු විදිහටම උදේ ඇවිදින්න ගියා.ගස් වලින් පලතුරු එකතු කරලා ඒවා කකා ගියේ.ගල් උඩින් පැන පැන, ඇඟේ මඩ ගාගෙන, ගස් අස්සෙ හැංගි හැංගි ගියා. ඇත්තටම කැලේ ඉන්න එකත් හරි විනෝදයි. අපි යන කැලෑ පාරේ වැදි කඩ ගොඩයි. අපේ අක්කා වැද්දා කැත්ත උස්සන් එනවා දැකලා ගහකට නැග්ගා. වැද්දා එයාට කැත්තෙන් ගහන්න යනවා කියලා හිතලා තියෙන්නේ. හැබයි එක ප්‍රශ්නයක්! අපේ අක්කට ගස් නගින්න පුලුවන්, බහින්න තමයි

බැරි. අක්කා හෙමිහිට අඩිය තියලා බහින්න හදනකොට ‘දඩෝං’ අක්කා ගහෙන් බිම. අපි එතන තිබුණු වැද්දිගෙ වෙද ගෙදරට ගියා. වැද්දි උණු වතුර බාල්දියකට මකුළුවෝයි, දෙහියි, රෙදි කෑල්ලකුයි දාලා උණු වෙන්ම අක්කාගේ කකුලට දැම්මා. අක්කා හූ තියලා නැගපු ගහ ගාවටම දිව්වා. දැන්නම් අක්කගේ කකුල හොඳයි වගේ.



රෑ වෙලා අපි කූඩාරමට ආවා. අක්කා ආපු වෙලේ ඉඳලා කියන්නෙ ආයේ නම් ඒ වැද්දි ළඟට යන්න ඕන නෑ කියලා. එයා ඔහොම කිව්වට ඒ වැද්දි තමයි එයාගේ කකුල හොඳ

කළේ.අපි රට මාශ්මෙලෝ කන්න තීරණය කළා.මාශ්මෙලෝ පුච්චන්නයි, කළුවරටයි අපි ගිනි මැලයක් ගහ ගත්තා. මාශ්මෙලෝ පෙට්ටිය ගේන්න නැගිට්ද්දි මගේ පස්සට ගිනි පුපුරක් ආවා.මගේ පස්ස පිච්චිලා මම ගිහින් අපි මූණ හෝදන වැවට පැන්නා. අම්මෝ එදානම් මට හරි අපල දවසක් කියලා මම අපේ අම්මටයි තාත්තටයි කිව්වා.

කරදර වලින් බේරිලා අපි හත් වෙනි දවසේ කැලයෙන් යන්න පිටත් වුණා. එන දවසටත් වඩා අපිට අද නම් සතුටුයි.අපි ඊළඟ සැරේ නම් වෙන කොහේට හරි යමු කියලා මම තාත්තාට කිව්වා. තාත්තා කිව්වා ආයෙ

කැලේකට එද්දි බස් එකක කට්ටියකුත් එක්ක එමු කියලා. “මේ කැලේට හැර වෙන ඕනම කැලයකට යමු අනේ”එහෙම කිව්වේ අපේ අක්කා.

අපි කාර් එකට නැගලා ආයෙත් චිප්ස් කකා එන කොට “හෝව් මං එනවෝ ටිකක් ඉන්නෝ” කවුරු හරි එහෙම කියනවා මට ඇහුනා. මම එලිය බැලුවා.වැද්දි අපේ පස්සෙන් එනවා.තාත්තා ඇයි කියලා ඇහුවා. “ඔයාලට මකුලු බෙහෙත ගන්න බැරි වුණා. ඒක දෙන්න මම ආවෙ” වැද්දි කිව්වා.

තාත්තා මකුලු බෙහෙත අරන් අක්කට දුන්නා. අක්කා ඒක වීසි කළා.තාත්තා අක්කට හිනා වුණා.



වැද්දිගේ බෙහෙත ගත්තට පස්සේ අපි කෑම කඩයක නවත්තලා කෑම කෑවා. අපි කෑම කඩයට යද්දි නැන්දලත් එතන. මම නැන්දාගෙන් ඇහුවා කොහෙද යන්නේ කියලා, එයාලත් කැලේට යනවලු. අපි ගෙදර ට එනවිට ගොඩාක් රෑ වෙලා. ආපු ගමන් නිදා ගත්තා. නැන්දලාටත් වැද්දි මුණගැසුනද දන්නේනෑ.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN : 978-624-206-817-6